**19. ශීර්ෂ 17 - පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය**

**19.1 විගණන විමසුම්වලට පිළිතුරු දීම**

කාර්යාලය වෙත ඉකුත් වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුමකට 2015 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**19.2 විසර්ජන ගිණුම**

**19.2.1 අයවැය පාලනය**

වැය විෂයයන් 06 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 13 සිට සියයට 59 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**19.3 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**19.3.1 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**19.3.2 විගණන හා කළමනාකරණ කමිටුව**

විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් වාරයක් පමණක් පවත්වා තිබුණි.

**19.4 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| **(අ)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| (i) | 2013 අප්‍රේල් 22 දිනැති අංක 05/2013 දරන චක්‍රලේඛයේ 02 (අ) උප ඡේදය | 34,000 | නිලධාරීන් 17 දෙනෙකු වෙත චක්‍රලේඛ විධිවිධාන ඉක්මවා නිල ඇඳුම් දීමනා ගෙවා තිබුණි. |
| (ii) | 2009 ජුනි 17 දිනැති අංක 09/2009(i) දරන චක්‍රලේඛයේ 02 (i) උප ඡේදය | - | කාර්යාලයයේ රජයේ නිලධාරීන් හා සේවකයින් තම සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම ඇඟිලි සළකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මඟින් සනාථ කර නොතිබුණි. |
| (iii) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 දරන චක්‍රලේඛයේ (iv) උප ඡේදය | - | නිත්‍ය රාජකාරී වේලාවෙන් පසුව ගෙවා තිබුණු දීමනා සඳහා පැමිණීමේ හා පිටවීමේ වේලාවන් ඇඟිලි සළකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මඟින් සනාථ කර නොතිබුණි. |
| **(ආ)** | **රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | |
| | 2008 අප්‍රේල් 24 දිනැති අංක 431 දරන චක්‍රලේඛයේ 1 ඡේදය | 428,355 | සාකච්ඡා, සම්මන්ත්‍රණ, පුහුණු වැඩසටහන් ඇතුළු සියළුම රාජකාරි ගමන් සඳහා විදේශ ගතවන සියළුම නිලධාරීන් කුමන අරමුදලින් වියදම් දැරුවද සිය ගුවන් යානා පත්‍ර ශ්‍රී ලංකන් එයාර්ලයින් සමාගමෙන් හෝ මිහින් ලංකා (පුද්ගලික) සමාගම වෙතින් මිලදී නොගෙන පෞද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබුණි. |

## 19.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

කාර්යාලය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනුවක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

2001 ජූලි 04 දිනැති අංක 11/575/ඊ/195/2 දරන ආයතන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මඟින් නිල මැදිරියේ රාජකාරි ඉටු කරන නිලධාරීන් සඳහා වර්ෂයකට කලිසම් 2 බැගින් හා ටියුනික් කොලරය සහිත කමිස 2 බැගින් ලබා දීමට අනුමැතිය ලබා දී තිබුණි. ඊට පටහැනිව ප්‍රධාන කළමනාකරණ සහකාර නිලධාරීන්ට, කළමනාකරණ සහකාර නිලධාරීන් 06 දෙනෙකුට හා පර්යේෂණ සහකාර නිලධාරිණියකට රු.6,000 බැගින් රු.48,000 ක් ගෙවා තිබුණි. පරිශ්කාර දීමනා වශයෙන් රු.3,000 සිට රු.3,500 ක් අතර මුදලක් මාසික දීමනාවක් ලෙස ගෙවා තිබියදීත් මෙසේ නිල ඇඳුම් දීමනාවක් ගෙවා තිබුණි.

## 19.6 විසඳා නොතිබුණු විගණන ඡේද

කාර්යාලයට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුලත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් කාර්යාලය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2013 | 4.3.3 | පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. |
| 2013 | 4.3 (අ) (i) | 2004 වර්ෂයේ සිට අවස්ථා 04 කදී වාර්ෂික වැටුප් වර්ධකයට අමතරව වැටුප් වර්ධක 10 ක් ලබා දී තිබුණි. |

## 19.7 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 03 | 03 | - |
| (ii) | තෘතියික මට්ටම | 01 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 10 | 08 | 02 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 14 | 11 | 03 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 03 | 03 | - |
| | එකතුව | 31 | 26 | 05 |